# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
### 2011 අප්‍රේල් / මැයි

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය - MACO - E 1025

### මාධ්‍ය ඉතිහාසය

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "19 වන ශතවර්ෂයේ දී මෙරට සමාජ, දේශපාලන, ආගමික සහ සංස්කෘතික බලය කේන්ද්‍රගත වූයේ පුවත්පත් මාධ්‍ය ඔස්සේ ය." ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය ආරම්භය සහ විකාශනය ඇසුරෙන් විමසන්න.

02. "සිනමාව, සමකාලීන සමාජ - දේශපාලන අංශයන්ගේ නිරූපණයකි." ශ්‍රී ලංකාවේ සිනමා වංශකතාවේ සංධිස්ථාන ඇසුරෙන් විමසන්න.

03. "ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි මාධ්‍ය බිහිවීම විවිධ අත්හදාබැලීම් සහ අරමුණු වලින් සමන්විත වූවකි." ලාංකීය ගුවන්විදුලි මාධ්‍යයේ වර්ධනය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

04. "ලාංකීය රූපවාහිනිය බිහිවන්නේ ලෝක රූපවාහිනිය ආරම්භවීමෙන් දශක ගණනාවකට පසුව ය." මේ කෙරෙහි බලපෑ හේතු සාධක දේශීය රූපවාහිනියේ ගමන්මග විමසුමට ලක්කරමින් පිරික්සන්න.

05. "නව සන්නිවේදන මාධ්‍ය නූතන සමාජයට බෙහෙවින් බලපෑම් කරයි." අන්තර්ජාලය, සමාජ ජාල සහ ජංගම දුරකථනය ඔස්සේ ක්‍රියාත්මක වන දේශීය සහ ගෝලීය සන්නිවේදන බලපෑම් ඇසුරෙන් විමසන්න.

06. "නිහඬ සිනමා යුගය ලෝක සිනමාවේ ආරම්භය සනිටුහන් කරයි." නිහඬ සිනමාවේ කැපීපෙනෙන සිනමාකරුවන්ගේ සොයාගැනීම් ඉදිරිපත් කරමින් මෙම අදහස පැහැදිලි කරන්න.

07. "ජනමාධ්‍යයේ ප්‍රථම විප්ලවය ආරම්භ වූයේ ලෝක පුවත්පත් මාධ්‍යයේ නැගීම තුළ ය." ලෝක පුවත්පත් කලාවේ ලක්ෂණ පාදක කරගනිමින් විමසන්න.

08. මාතෘකා <u>හතරක් (04)</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

    1. ලන්දේසි සමයේ මුද්‍රණ ශිල්පය
    2. ලෝක රූපවාහිනී මාධ්‍ය ඉතිහාසය
    3. බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සේවය
    4. කඩදාසි සොයාගැනීම
    5. බී. ඒ. සිරිවර්ධන
    6. ඩී. බී. ධනපාල

****************************************